# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**


| මගේ අංකය<br>எனது<br>My No: | ඔබේ අංකය<br>உமது<br>Your No: | දිනය<br>திகதி<br>Date |
|---|---|---|
| DSD/HQ/06/EP/03/විශේෂ ව්‍යාපෘති/2024 | ............................................ | 2024.03.07 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් ,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්
සියළුම සමෘද්ධි කළමනාකරුවන්/සංවර්ධන නිළධාරින්/සමෘද්ධි සංවර්ධන නිළධාරින්.

**<u>සමෘද්ධිලාභී/අස්වැසුමලාභී හා අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා ජපන් භාෂා ප්‍රවීණතාවය ලබා දීමේ වැඩසටහන-2024.</u>**

උක්ත මැයෙන් මාගේ සමාංක හා 2024.01.05 හා 2024.02.07 දිනැති ලිපිවලින් ලබාදුන් උපදෙස් වලට අමතර වශයෙනි.

02.ඊට අදාලව උක්ත වැඩසටහන යටතේ ජපන් භාෂා පාඨමාලා ප්‍රාදේශීය ජපන් භාෂා පුහුණු මධ්‍යස්ථානවල 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කිරිම පිළිබඳව සමාජ සවිබල ගැන්විමේ රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2024.03.04 දින ප.ව.3.00ට Zoom තාක්ෂණය ඔස්සේ පැවැති රැස්විමේදී අවධාරණය කරන ලද කරුණු පිළිබඳ ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

03. එහිදි ගනු ලැබූ තීරණ අනුව 2024 වර්ෂය සඳහා ආරම්භ කිරිමට නියමිත ජපන් භාෂා පාඨමාලා අදාල පුහුණු මධ්‍යස්ථාන වලදි සමාරම්භක කටයුතු සිදුකිරිමට ප්‍රථම සමෘද්ධි අලෙවි අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගැනිම අත්‍යවශ්‍යවේ. ඒ සඳහා පහත සඳහන් ලිපිලේඛණ හා වාර්තා හා ඇමුණුම් ඇතුලත් තොරතුරු අධ්‍යක්ෂ අලෙවි වෙත යොමු කල යුතුවේ.(samurdhimarketing@gmail.com)

1. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ හා ප්‍රාදේශීය ලේකම්ගේ අත්සනින් යුත් ආවරණ ලිපි ඉදිරිපත් කිරිම.
2.මේ සමඟ දක්වා ඇති ඇමුණුම් අංක 01 වාර්තාව.
3.ජපන් භාෂා ගුරුවරයාගේ/ ගුරුවරියගේ ජීව දත්ත අයදුම්පත
4.ගුරුවරයාගේ/ගුරුවරියගේ ජපන් භාෂා ප්‍රවීණතාවයට අදාල සහතික

04. ජපන් භාෂා පාඨමාලා පැවැත්විමේදී විෂය නිර්දේශයට අනුව හඳුන්වා දෙනු ලබන මාසික පාඨමාලා අන්තර්ගතයන්ට අදාලව ආදර්ශ විභාග මාසිකව පැවැත්විමට නියමිතය. ඒ සඳහා දිවයින පුරා ආරම්භ කරනු ලබන සියළු මධ්‍යස්ථාන වල සිසුන්ගේ දැනුම මට්ටම එක හා සමාන වියයුතු බැවින් දැනට හඳුනා ගෙන ඇති සියළු මධ්‍යස්ථාන වල පාඨමාලා කටයුතු **2024.03.15 දිනට ප්‍රථම** අලෙවි අංශයේ අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගැනිමෙන් අනතුරුව ආරම්භ කරන මෙන් කාරුණිකව දන්වමි. කෙසේ වුවද විවිධ ප්‍රායෝගික දුෂ්කරතා මත ඒ දිනට පෙර පාඨමාලා ආරම්භ කිරිමට නොහැකි මධ්‍යස්ථාන වල පමණක් මාර්තු මස 31 දිනට පෙර අලෙවි අංශයේ අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගෙන පාඨමාලා ආරම්භ කරන මෙන් කාරුණිකව දන්වමි.

05. එලෙස ප්‍රාදේශීය ජපන් භාෂා පුහුණු මධ්‍යස්ථාන වල පාඨමාලා කටයුතු මෙහෙයවිමට අමතරව දිස්ත්‍රික් මට්ටමින් එක් විශාල ළමුන් සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් යුතු (500 ක් පමණ) පංති ආරම්භ කිරිමට කටයුතු සැලැසුම් කල යුතුවේ. එමෙන් ම මේ දක්වා පාඨමාලා කටයුතු සඳහා සිසුන් හඳුනා ගෙන ඇති එහෙත් ජපන් භාෂා ගුරුවරයකු තෝරා ගැනිමට නොහැකිවූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ළමුන් පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් අලෙවි විෂය භාර කළමනාකරු විසින් සකස් කර අදාල දිස්ත්‍රික් වාර්තාව ඇමුණුම් 2 පරිදි 2024.03.12 දිනට ප්‍රථම samurdhimarketing@gmail.com ඊමේල් ලිපිනය වෙත යොමු කල යුතුවේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28** |

06.පාඨමාලාවට සහභාගිවන සිසුන් විසින් තම ජාත්‍යන්තර විභාගයන් සඳහා (JLPT,NAT,JFT)යන විභාග සඳහා පෙනී සිටීමේදී ඒ සඳහා වන විභාග ගාස්තු සිසුන් යුතු වන අතර අදාල විභාග පැවැත්වෙන දිනය හා ඒ සඳහා ඉල්ලුම් කලයුතු දිනයන් පිළිබඳ තොතුරු අදාල ජපන් භාෂා ගුරුවරුන් මගින් සිසුන් වෙත ලබාදීමට අවශ්‍ය උපදෙස් ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා දිය යුතුවේ.

07. ජාත්‍යන්තර විභාග පැවැත්වෙන දිනයන්:-

- NAT විභාග පැවැත්වෙන දිනයන්

  මෙම විභාගය සෑම මාස දෙකකට වරක් ම පවත්වනු ඇත.

  2024 - පෙබරවාරි 25<br>
  2024 - අප්‍රේල් 21<br>
  2024 - ජූනි 09<br>
  2024 - අගෝස්තු 11<br>
  2024 - ඔක්තෝබර් 06<br>
  2024 - දෙසැම්බර් 12

- JLPT විභාග පැවැත්වෙන දිනයන්

  මෙම විභාගය ජූලි හා දෙසැම්බර් මාසවල පලමු ඉරිදා දින ජාත්‍යන්තරව වසරකට දෙවතාවක් පැවැත්වේ.

  2024 - ජූලි - 07<br>
  2024 - දෙසැම්බර් - 03

- JFT විභාග පැවැත්වෙන දිනයන්

  මෙම විභාගය වසරේ සෑම දින 45 කට වරක් ම පැවැත්වීමට කටයුතු කෙරේ. මේ පිළිබඳ විස්තරාත්මක තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ www.slbfe.gov.lk වෙබ් අඩවිය පරිශීලනය කිරිමෙන් දැනගත හැකිවේ.

**වැඩසටහනේ ආදායම් හා වියදම් කටයුතු සිදුකිරිම:-**

මේ සඳහා දැනට හඳුන්වා දී ඇති සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ගිණුම් ක්‍රියාවලිය යටතේ ලබාදී ඇති උපදෙස් වලට යටත්ව එම වැඩසටහනේ ගිණුම් කටයුතු පවත්වා ගෙන යායුතුවේ.එමෙන්ම ඕනෑම අවස්ථාවක සෝදිසි විගනන කටයුතු සිදුකිරිම සඳහා වවුචර්පත් හා ආදායම් වියදම් සටහන් කරන ලද පොත්පත්,රෙජිස්තරයන් හා ගිණුම් ලෙජරයන් මනාව පවත්වා ගෙන යායුතු වේ.

**පැමිණිමේ ලේඛණ පවත්වා ගෙන යාම හා වාර්තා ඉදිරිපත් කිරිම:-**

මේ යටතේ ජපන් භාෂා ගුරුවරුන්ගේ හා සිසුන්ගේ පැමිණිමේ ලේඛණ (පැමිණිමේ හා පිටවීමේ වේලාවන් සහිතව) මනාව පවත්වා ගෙන යායුතු අතර ඒවායේ පිටපත් මාසිකව සත්‍ය පිටපත් බවට සහතික කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත හා අලෙවි සංවර්ධන අංශයේ අධ්‍යක්ෂ වෙත එළඹෙන මස 05 වන දිනට ප්‍රථම එවිය යුතු වේ.අදාල වාර්තා වල ආකෘති පත්‍ර ඇමුණුම් අංක 3 හා 4 දක්වා ඇත.මීට අමතරව අදාල ගුරුවරයාගේ/ගුරුවරියගේ ජාතික හැඳුනුම්පතක් හා බැංකු පාස්පොතෙහි මුල්පිටුවේ ඡායා පිටපත් සත්‍ය පිටපත් බවට සහතික කර එවිය යුතු වේ

සී.ඩී.කළුආරච්චි<br>
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:- 01.ලේකම්, කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.<br>
02. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික සමාජ සංවර්ධන ආයතනය - කා.දැ.ගැ.පි.<br>
03. සාමාන්‍යාධිකාරි - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - කා.දැ.ගැ.පි.